# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

# பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

# CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/03/01/පොදු-Covid 19/2020 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.10.21 |

දකුණු පළාත් සභාවේ,
ආණ්ඩුකාර ලේකම්
සභා ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්)
අමාත්‍යාංශ ලේකම් (ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර) අමාත්‍යාංශය
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>කොවිඩ් 19 වසංගත තත්වය පවතින කාලය අතරතුර රාජ්‍ය ආයතන තුළ රාජ්‍ය සේවාවන් ප්‍රශස්ත අයුරින් පවත්වා ගැනීම.</u>**

කොවිඩ් 19 අවධානම අවම කර ගැනීම සඳහා සංචරණයන් සීමා කිරීම සුදුසු බව නිරීක්ෂණය වන හෙයින් මගේ සමාංක හා 2020.05.11, 2020.10.08 දිනැති ලිපි අනුව කොවිඩ් මර්ධන සෞඛ්‍ය උපදෙස් කෙරෙහි නැවත ඔබගේ අවධානය යොමු කරවමි.

02. මෙහිදී 2020.11.06 දින දක්වා ඔබ කාර්යාලයේ එදිනෙදා රාජකාරී වලට බාධාවක් නොවන අයුරින් සෑම ආයතනයකම 50% ක සීමාවකට යටත්ව නිලධාරීන් හට සේවයට වාර්තා කළ හැකි අතර අත්‍යවශ්‍ය සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා කටයුතු කළමනාකරණය කළ යුතු ය. එසේ වුව ද සියළුම මාණ්ඩලික නිලධාරීන් සේවයට වාර්තා කළ යුතු වේ.

03. එසේම ඉහත කාල සීමාව තුළ නිලධාරීන්ගේ ඇඳුම සම්බන්ධයෙන් රා.ප.චක්‍රලේඛ 01/2020 හි 02 ඡේදයේ (ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ හැකි ය.

04. ඉහත උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී මහජනතාවට ප්‍රශස්ත හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ කටයුතු අදාළ සෞඛ්‍ය උපදෙස් පරිදි සිදු විය යුතු අතර කාර්යාලයීය නිලධාරීන්ගේ පහසුව කෙරෙහිද අවධානය යොමු කර කටයුතු කිරීමට සියළුම ආයතන ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු ය.

05. මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**ආර්.සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත.**


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 2234052<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"